පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
බස්නාහිර පළාත
மாகாண சுகாதார சேவைகள் பணிப்பாளர் அலுவலகம்
மேல் மாகாணம்
OFFICE OF THE PROVINCIAL DIRECTOR OF HEALTH SERVICES
WESTERN PROVINCE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WP/PD/ES/3/PHLT/AT/2025 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2025.11. |

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කොළඹ/ ගම්පහ/ කළුතර
අධ්‍යක්ෂ, දිස්ත්‍රික් මහ රෝහල
අවිස්සාවේල්ල/ ගම්පහ/ හොරණ
වෛද්‍ය අධිකාරී, මූලික රෝහල,
හෝමාගම/ වතුපිටිවල/ මීරිගම/ මිනුවන්ගොඩ/ පානදුර/ පිඹුර

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2026 අයදුම්පත් කැඳවීම</u>**
**<u>මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී.</u>**

උක්ත මැයෙන් යුතු මගේ සමාංක දරණ 2025.11.07 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. "2025.04.09 වන දින පවත්වා ඇති අතුරු වෛද්‍ය සේවයේ තනතුරුවල වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡාවේ වාර්තාවට අනුව සිදු කරනු ලබන සංශෝධනයයි" යන මැයෙන් යුතුව මා සහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් අමතා ඇති බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක WPH/ADM/17/01/07-1 දරණ 2025.11.18 දිනැති ලිපිය මගින් කරන ලද දැනුම් දීමට අනුව මගේ සමාංක දරණ 2025.11.07 දිනැති ලිපිය සමග ඔබ වෙත යොමු කරන ලද වාර්ෂික ස්ථාන මාරු කැඳවීම් නිවේදනයේ (ඇමුණුම අංක 01 හි) 2.1(ඇ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරන බව දන්වා සිටිමි.

2.1(ඇ) 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා නව සේවා ස්ථානවලට වාර්තා නොකළ නිලධාරීන් හට ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට මෙම අවස්ථාවේ දී හැකියාව නොමැත.

03. එසේම එම කැඳවීම් නිවේදනයේ 01 ඡේදයේ එන "මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්න " මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී" ලෙස සංශෝධනය විය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

04. ඒ අනුව මෙ පිළිබඳව සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

වෛද්‍ය ධම්මිකා ජයලත්
බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

පිටපත්:-
1) ආණ්ඩුකාර ලේකම්(බ.ප) - කරු.දැ.ගැ.ස.
2) ලේකම්,සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3) අංශ ප්‍රධානි,තොරතුරු තාක්ෂණ අංශය - web අඩවියේ පළ කිරීම සඳහා
4) මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී වෘත්තිය සංගමය- කරු.දැ.ගැ.ස.



| | කාර්යාලය Office | පළාත් අධ්‍යක්ෂ Provincial Director | සැලසුම් අංශය Planning Unit | නි.අධ්‍යක්ෂ(පාලන) Deputy Director(Admin) | ප්‍රධාන ගණකාධිකාරී Chief Accountant | පරිපාලන නිලධාරී Adm. Officer |
|---|---|---|---|---|---|---|
| T.P | 0112434660 | 0112437154 | 0112478677 | 0112434852 | 0112437155 | 0112478868 |
| Fax | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 | 0112478872 |
| e-mail | info@healthdept.wp.gov.lk | pd@healthdept.wp.gov.lk | info@healthdept.wp.gov.lk | | | |

10 Maligawatta Secretariat Building, P.O. Box 876, Colombo 10.
www.healthdept.wp.gov.lk